**උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2018**

-----------------------------------------------------------

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එළඹි 2014 සැප්තැම්බර් 12 දිනැති අංක 5428 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II (බී)(3) වගන්තිය හා 2016 ජූලි 20 දිනැති අංක 5800 - එල්කේ දරන අතිරේඛ මූල්‍ය ගිවිසුම ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

-----------------------------------------------------------------------------------------

මූල්‍ය ගිවිසුම අනුව, එවකට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාප්‍රවාහන අමාත්‍යාංශය, වර්තමාන නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 34,912.48 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 257.08 ක් වන අතර ඉන් රු. මිලියන 27,507 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 202 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 7,405.40 ක මුදල ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතව තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ කාලය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

------

මෙම වාර්තාවේ 2 වගුවෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| දේපල අත්පත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබුණු වන්දි මුදල්වලින් රඳවාගත් රු.මිලියන 13.5 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගෙවිය යුතු මුදල් අඩුවෙන් දැක්වීම. | උපකාරක වියදම් සම්බන්ධයෙන් හැර උපචිත පදනම අඛණ්ඩව අනුගමනය කරන ලදී. | සමාලෝචිත වර්ෂය අවසානයට තිබුණු ගෙවිය යුතු රඳවාගත් මුදල් ගිණුම්වලට ඇතුලත් කළ යුතුය. |

### 2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| මූල්‍ය ගිවිසුමේ ii වගන්තිය | ලබාගත් ණය මුදල් උපයෝජනය කර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.31 ක දේශීය බදු ගෙවා තිබුණි. | ණය අරමුදල වැඩියෙන් දැක්වීම. | ජාතිය ගොඩනැගීමේ බදු රාජ්‍ය අරමුදලට මාරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම හා මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ වැඩ කටයුතුවල භෞතික කාර්යසාධනය

මහනුවර, ගාල්ල හා යාපනය යන සහභාගීත්ව නාගරික ප්‍රදේශයන් තුළ නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණු අතර එම කාර්යයන් සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණ | බලපෑම | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| මහනුවර නගර ප්‍රදේශය තුළ මැදිහත් වීම් | දිගන මාර්ගයේ කටුගස්තොට - මඩවල කොටස ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම. | මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව එ.ජ.ඩොලර් මිලියන 10.77 කට සමාන රු.මිලියන 1,614.96 ක මුදලකට ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත් කටයුතු | කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමට සිදුව තිබුණු අතර එය ව්‍යාපෘතියේ සමස්ථ කාල සටහනට බලපා තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ භෞතික හා මූල්‍ය ශක්තිය පිළිබඳව ඇගයීමට අපොහොසත් වී තිබීම. | අදහස් දක්වා නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන් ඉටු කරනු ලබන කාර්යයන් නියාමනය කිරීමට හා අධීක්ෂණය කිරීමට ශක්තිමත් හා කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ ක්‍රමවේදයක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2016 ජුලි 07 දින ආරම්භ කර තිබුණි. පසුව එ.ජ.ඩොලර් මිලියන 2.62 කට සමාන රු.මිලියන 392.73 ක් වැය කිරීමෙන් පසුව කොන්ත්‍රාත් කටයුතු 2017 සැප්තැම්බර් 06 දින අත්හිටුවා තිබුණි. රු.මිලියන 242.24 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය නොවී පැවතුණි. | | | | ක්‍රියාත්මක කළ යුතුය. |
| ධර්මාශෝක මාවත පුනරුත්තාපනය කිරීම හා වැඩිදියුණු කිරීම. | මාර්ගයේ කොන්ත්‍රාත් වැඩ කටයුතු 2016 ජූලි 07 දින ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත් එම දිනට සියයට 45 ප්‍රගතියක් පමණක් දක්නට ලැබුණි. | මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු ප්‍රමාද වීමට ඉඩ තිබීම. | කොන්ත්‍රාත්කරුගේ දුර්වලතාවයන් සහ ඇතැම් සමාජීය ප්‍රශ්ණ | අදහස් දක්වා නැත | - එම - |
| මැද ඇල පුනරුත්තාපනය කිරීම | මහනුවර මැද ඇල පුනරුත්තාපනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2017 ජූලි 17 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, 2018 දෙසැම්බර් 31 දින වන විට සියයට 68 ක් වූ භෞතික ප්‍රගතියක් පමණක් නිරීක්ෂණය වූ අතර කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2018 මැයි 31 දින සමාපනය කර | අතිරේක පිරිවැයක් දැරීමට සිදු වීම. | කොන්ත්‍රාත්තුවේ විෂය පථය වෙනස් කිරීම සහ නියමිත පරිදි අධීක්ෂණයක් නොවීම. | කොන්ත්‍රාත්තුව 2018 මැයි 31 දින සමාපනය කරන ලද අතර කොන්ත්‍රාත් වැඩබිම 2018 ජූලි 19 දින භාරදෙන ලදී. | - එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | තිබුණි. කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු සමාපනය කරන ලද දිනට ඒ සඳහා රු.මිලියන 133.75 ක් වැයකර තිබුණි. | | | | |
| | මහනුවර නගරයේ වර්ෂා ජලය බැස යාමට පොළොව යටින් දිවයන කානු පද්ධතිය පුනරුත්ථාපනයකිරීම | මහනුවර නගරයේ පොළොව යටින් දිවෙන වැසි වතුර බැස යාමේ නල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවලට අදාල කොන්ත්‍රාත්තුව රු.මිලියන 1,016 ක ඇස්තමේන්තුගත පිරිවැයට ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2018 අප්‍රේල් 25 දින ආරම්භ කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 25 ක් වුවද එදිනට භෞතික ප්‍රගතිය සියයට 4 ක් පමණක් විය. | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදු වීම. | ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් වැඩ කටයුතු සඳහා යොදවා නොතිබීම. | කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය කරන අත්‍යාවශ්‍ය සේවකයන් හා යන්ත්‍ර උපකරණ මූලික අදියරයේදී සේවයට යොදවා නොතිබුණි. | - එම - |
| මහනුවර නොම්ලින් උද්‍යානය වැඩිදියුණු කිරීම | 2018 දෙසැම්බර් 31 දිනට සියයට 27 ක භෞතික ප්‍රගතියක් ලඟාකර ගැනීමට අපේක්ෂා කර තිබුණද, එම දිනට ලඟාකරගෙන තිබුණු | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදු වීම. | සැලසුම්කරණ දුර්වලතා | නැවත සකස් කරන ලද නිර්මාණ සැලසුම් හා චිත්‍ර සටහන් නැවත කොන්ත්‍රාත්කරු වෙත ලබා දීමට උපදේශ | | කොන්ත්‍රාත්කරුවන් ඉටු කරනු ලබන කාර්යයන් නියාමනය කිරීමට හා අධීක්ෂණය කිරීමට ශක්තිමත් හා කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | භෞතික ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. | | | කවරයාට සිදු වීම. | | |
| | නගර සහා මෝටර් රථ අංගනයෙහි මුදුන් වහලය වැඩිදියුණු කිරීම | වැඩිදියුණු කිරීමේ වැඩ කටයුතුවල සියයට 47 ක භෞතික ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය අවසානයට ලභාකර ගැනීමට අපේක්ෂා කර තිබුණද, ලභාකරගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 29 ක් පමණක් විය. | වැඩ කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන් ඇතිවිය හැකි අතර කොන්ත්‍රාත්කරුවන්ගේ අතිරේඛ බිල්පත් හේතුවෙන් අලාභයන් සිදුවීම. | ගොඩනැගිල්ලේ බිම් මහලෙහි පිහිටි කඩ සාප්පු වෙනස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම. | වැඩ කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| ගාල්ල නගර බල ප්‍රදේශය සඳහා මැදිහත් වීම් කටයුතු | ගාල්ල - බද්දේගම මාර්ගයේ මොරගොඩ ඇල හරහා දිවෙන කහතුඩුව පාලම නැවත ඉදිකිරීම. | පාලම නැවත ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතුවල අඩු ප්‍රගතිය හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 54.5 ක මුදලින් රු.මිලියන 22.4 ක් වැය කළ පසුව කොන්ත්‍රාත්තුව සමාපනය කර තිබුණි. | අතිරේඛ පිරිවැයක් දැරීමට සිදු වීම. | කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ කටයුතු සුපරීක්ෂණය නොකිරීම. | අදහස් දක්වා නැත. | ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | මොරගොඩ ප්‍රධාන ඇල මාර්ගය හා පන්සල් අතුරු ඇල ප්‍රතිසංස්කරණය කිරීම. | 2018 දෙසැම්බර් 31 දිනට මොරගොඩ ප්‍රධාන ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 65 ක් දක්වා අපේක්ෂා කර තිබුණද එම දිනට තථ්‍ය ප්‍රගතිය සියයට 19 ක් පමණක් විය. | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට ඉඩකඩ තිබීම. | කොන්ත්‍රාත්කරුවන් දුර්වල කාර්යසාධනය සහ කොන්ත්‍රාත් කටයුතු අධීක්ෂණය නොකිරීම. | කොන්ත්‍රාත්තුවේ දුර්වල කාර්යසාධනය හේතුවෙන්, එහි භෞතික ප්‍රගතිය අපේක්ෂා කළ මට්ටමට වඩා පහල තත්ත්වයක් පෙන්නුම් කෙරුණි. | කොන්ත්‍රාත් කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් එකතුව රු.මිලියන 1,237 ක මුළු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින්, රු.මිලියන 161.50 ක මුදලක් වර්ෂ 3 කට වැඩි කාලයක් අය නොවී පැවතුණි. කොන්ත්‍රාත්කරුවන්ට අතිරේඛ මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම මඟින්, අත්තිකාරම් අයකර ගැනීමට ව්‍යාපෘතිය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | මහජන මුදල් අයථා පරිහරණයට ඉඩකඩ සැලසීම හා වංචාකාරී කටයුතුවල නියැලීමට ඉඩකඩ සැලසීම. | කොන්ත්‍රාත්තුව සමාපනය කළ කොන්ත්‍රාත්කරුවකුගෙන් රු.මිලියන 161.5 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් අයවීමට නියමිතය. එසේ වුවත් සියලුම අත්තිකාරම් බැංකු ඇපකර මඟින් අයකර ගනු ලැබේ. | හැකි ඉක්මනින් අත්තිකාරම් පියවීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට බලපෑම් කළ යුතුය. |
| (ආ) | ආතර්ගේ නැරඹුම් බැංකුව ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු රු.මිලියන 24.22 ක පිරිවැයකින් නිමකර තිබුණි. එසේ වුවත්, අදාල ස්ථානයෙහි සවිකර තිබුණු විදුලි උපාංග නාඳුනන පිරිසක් විසින් විනාශ කර තිබීම නිසා එම පරිශ්‍රයට විදුලිය සපයා නොතිබුණු බව වැඩ බිමෙහි සිදුකළ විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | සේවය සැපයීමට අපේක්ෂා කළ පාර්ශවයන් වෙත බලාපොරොත්තු වූ ප්‍රතිලාභ ලඟා වී නොතිබුණි. | අදාල විදුලි උපාංග සවි කිරීමට කටයුතු කරනු ලැබේ. | පරිශ්‍රයේ ආරක්ෂාව වැඩි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය මඟින් උප ව්‍යාපෘති 26 ක් රු.මිලියන 1,333 ක ඇස්තමේන්තුගත පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේ වුවත් එම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 31 දින දක්වාම ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට සිදු වීම. | අදාල උප ව්‍යාපෘති පසුව ක්‍රියාත්මක කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුගත විය යුතුය. |
| (ඈ) | පිළිවෙලින් රු.මිලියන 9,316.60 ක හා රු.මිලියන 899 පිරිවැය ඇස්තමේන්තු මත ක්‍රියාත්මක කරන ලද මහනුවර බහුකාර්ය ප්‍රවාහන පර්යන්තය හා ගැටඹේ ජල පිරිපහදු යන්ත්‍රාගාරයෙහි කොන්ත්‍රාත් කටයුතු | ව්‍යාපෘතියෙහි අරමුණුගත ප්‍රතිලාභීන් වෙත බලාපොරොත්තු වූ ප්‍රතිලාභ නොලැබීම. | එම කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුගත විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළදී අත්හිටුවා තිබුණි. | | | |
| (ඉ) | යාපනය නගර සංවර්ධන කාර්යයන් සඳහා වන උපදේශක සේවාවන් සඳහා රු.මිලියන 144 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අවශ්‍ය උපදේශන සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි. එසේම, යාපනය අර්ධද්වීපයේ යෝජිත කොන්ත්‍රාත් කටයුතු සඳහා කොන්ත්‍රාත් පහසුකම් සැලසීමේ කටයුතු සඳහා රු.මිලියන 5.8 ක මුදලක් වෙන්කර තිබුණද, එම කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතියෙහි අරමුණුගත ප්‍රතිලාභීන් වෙත බලාපොරොත්තු වූ ප්‍රතිලාභ නොලැබීම. | අදාල ව්‍යාපාරික සැලසුම් අවසන් කරන තෙක් නිර්මාණ උපදේශකවරයාගේ වැඩකටයුතු ආරම්භ නොකරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මට අනුගත විය යුතුය. |
| (ඊ) | ගාල්ල නගර යාවත්කාලීන කිරීමේ කටයුතු සඳහා මූල්‍ය උපදේශන වාර්තාව 2017 අප්‍රේල් 27 දින ලබා දීමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 61.36 ක අත්තිකාරම් මුදලක්ද නිදහස් කර තිබුණි. එසේ වුවත්, එම සැලසුම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලබාදී නොතිබුණි. මෙයට අමතරව, අදාල උපදේශන සේවාවන්ගේ කොටස් කීපයක් නිම කිරීම සඳහා වෙනත් උපදේශකවරුන් 11 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර රු.මිලියන 15.81 ක් ඒ සඳහා ගෙවීම්ද කර තිබුණි. උපදේශක සේවාවන් සැපයීමේ ප්‍රමාදයන් හේතුවෙන් ගාල්ල නගරය යාවත්කාලීන කිරීමේ කොන්ත්‍රාත් කටයුතුවල මන්දගාමී තත්ත්වයක් පෙන්නුම් කෙරුණි. | කොන්ත්‍රාත්තු වේ කාලය දීර්ඝ කිරීමට සිදුවිය හැකි අතර පිරිවැයද ඉහළ යා හැකිය. | එකඟ වේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුගත විය යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වත්කම් උපයෝජනය කිරීමේ සැලැස්මක් නොවීම නිසා, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 278.7 ක | යන්ත්‍ර හා උපකරණවලට හානි සිදුවිය හැකි වීම සහ | මහාමාර්ග දෙපාර්තමේන්තුවට හා මහනුවර මහානගර සභාවට ලබාදී ඇති යන්ත්‍ර හා | මූල්‍ය කළමනාකරණයේ කොටසක් ලෙස ශක්තිමත් වත්කම් කළමනාකරණ |

| | | | | |
|---|---|---|---|---|
| | පිරිවැයකට මිලටගෙන නඩත්තු කටයුතු කරගෙන යාම සඳහා මහනුවර ගාල්ල මහානගර සභාවලට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණු යන්ත්‍ර හා උපකරණ උපයෝජනය කිරීමකින් තොරව ඉහත සඳහන් කරන ලද ආයතන පරිශ්‍රයන්වල නිශ්කාර්යව තබා තිබුණි. තවද, රු.මිලියන 120 ක පිරිවැයකට 2016 වර්ෂයේ මිලටගෙන තිබුණු ජලනල හා උපාංග තොගයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා භාවිතා කිරීමකින් තොරව ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩල භූමියේ නිෂ්කාර්යව තබා තිබුණි. | අනවසර භාවිතයන් සඳහා යොදාගත හැකිවීම. | උපකරණ එම ආයතනවල එදිනෙදා කටයුතු සඳහා යොදවාගනු ලබයි. | ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. |
| (ආ) | මහනුවර හීරුස්ගල හා දංගොල්ල යන ප්‍රදේශවල ජීවත්වන පවුල් 300 කට ජල පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 76.5 ක පිරිවැයක් දරා ජල ටැංකි 03 ක් ඉදි කර ජලනල එලීම හා ජල සැපයුම් මෝටර් සවි කිරීම නිමකර තිබුණි. එසේ වුවත් ජල පහසුකම් සැපයීම 2019 මැයි 31 දක්වාම සිදුකර නොතිබුණි. | ඉලක්කගත පාර්ශවයන් වෙත අදාල ප්‍රතිලාභ නොලැබීම. | ජල පොම්පාගාර 2019 මැයි 02 දින මහනුවර මහනගර සභාව වෙත භාරදී ඇති අතර එය දැනට ක්‍රියාත්මකව පවතී. | ප්‍රමාදයට හේතූන් සොයා බැලිය යුතුය. |
| (ඇ) | ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ලබාදී තිබුණු රු.මිලියන 27,507 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 202 ක මුදලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 4 ½ ක් ගත වූ පසුවද උපයෝජනය කර තිබුණත් එ.ජ.ඩොලර් මිලියන 36.28 කට සමාන රු.මිලියන 5,638.31 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 18 ක් පමණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී යාපනය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා | ව්‍යාපෘතියෙහි සැලසුම් කළ කාලය තුල ව්‍යාපෘති කටයුතු නිම කිරීමට නොහැකි වීම. | රටේ පැවති දේශපාලන වෙනස් වීම් හේතුවෙන් ව්‍යාපෘතියෙහි මුල් අවුරුදු 2 ½ තුළ වූ ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. | ව්‍යාපෘතිය සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ එම වැඩකටයුතු නිම කළ යුතු අතර ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුළු මුදලම සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගත යුතුය. |

වෙන්කර දී තිබුණු රු.මිලියන 1000 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 5.37 ක් මුදලින් ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා විධිමත් වැඩ සැලසීමක් නොවීම නිසා 2018 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කර තිබුණේ රු.මිලියන 244.26 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 1.40 ක් පමණි.

**3.4 මානව සම්පත් කළමනාකරණයට අදාළ නිරීක්ෂණ**

---

ව්‍යාපෘතියෙහි අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 194 කින් සමන්විත වුවද, අතිරේඛ ව්‍යාපෘති අධ්‍යක්ෂ, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ හා සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ යනාදි ප්‍රධාන තනතුරු 9 ක්ද ඇතුලත්ව තනතුරු 71 ක පුරප්පාඩු වර්ෂ 2 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු පිරවීමට 2018 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට හා ව්‍යාපෘතියෙහි පහල ප්‍රගතිය කෙරෙහි ඉහත දන්වන ලද කාර්ය මණ්ඩල පුරප්පාඩු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.5 පද්ධති හා පාලන**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | එ.ජ.ඩොලර් මිලියන 79.94 පිරිවැයකට ඇස්තමේන්තු කරන ලද ප්‍රසම්පාදන කටයුතු 12 ක් සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතිය විසින් අවලංගු කර තිබුණි. තවද, එ.ජ.ඩොලර් මිලියන 10.37 කට ඇස්තමේන්තු කර තිබුණු උපදේශන සේවා කොන්ත්‍රාත් 21 ක්ද අවලංගු කර තිබුණි. | මෙය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට සහ ප්‍රතිලාභ කෙරෙහි බලපානු ලබයි. | දැනට කරමින් පවතින මහනුවර මලාප්‍රවාහන ව්‍යාපෘතිය හේතුවෙන් ඇතැම් ව්‍යාපෘති කාර්යයන් ප්‍රතිස්ථාපනය කරන ලද අතර ඇතැම් කාර්යයන් කරගෙන යාමට නොහැකි විය. | පසු සැලසුම් ව්‍යාපෘති කාර්යයන්ට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ඇගයුම් ලියවිල්ලේ 11 ඡේදයේ සඳහන් නියමයන්ට අනුකූලව, සැලසුම් කරන ලද කාර්යයන් පදනම් කරගෙන විස්තරාත්මක අයවැය ලේඛණයක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර | ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණ පාලනය දූර්වල වීම හා ව්‍යාපෘතියෙහි කාලය දීර්ඝ | ගාල්ල නගරයෙහි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ කාර්යයන් අත්හැර දැමීම නිසා මෙකී ඉතිරි වීම් සිදුවිය. | ව්‍යාපෘති කාර්යයන් ඵලදායීව සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. මෙම නිසා, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛණය මඟින් ප්‍රතිපාදනය කරදී තිබුණු රු.මිලියන 5,100 ක මුදලින් රු.මිලියන 2,746 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | කිරීමට සිදුවිය හැකි වීම. | | |
| (ඇ) | ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන විශේෂ (ඩොලර්) ගිණුමේ 2018 ජනවාරි 01 දිනට පැවති එ.ජ.ඩොලර් 4.23 කට සමාන රු.මිලියන 647.35 ක ආරම්භක ශේෂය හා 2018 වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණු එ.ජ.ඩොලර් මිලියන 18.80 කට සමාන රු.මිලියන 2,939.46 ක මුදලද ඇතුලත්ව එම ගිණුමෙහි පැවති එ.ජ.ඩොලර් මිලියන 16.49 කට සමාන රු.මිලියන 2,473.50 ක මුදලින් එ.ජ.ඩොලර් මිලියන 13.12 කට සමාන රු.මිලියන 2,206.51 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුලදී නැවත ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම නිසා, ව්‍යාපෘති කටයුතුවල පහල ප්‍රගතිය හා මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ කරන ලද දුර්වල පුරෝකතනයන් හේතුවෙන් එ.ජ.ඩොලර් මිලියන 9.84 කට සමාන රු.මිලියන 1,799.21 ක් 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කිරීමකින් තොරව එම ගිණුමෙහි රැදී තිබුණි. | ණය ලබා දීමේ නියෝජිතායතනය මඟින් වෙන්කර දෙන ලද අරමුදල් උපයෝජනයෙහි වූ සැලසුම් දුර්වලතා | සැලසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන්, වෙන් කරන ලද අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ නොහැකි විය. | අරමුදල් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.6 මතභේදයට තුඩුදෙන කරුණු**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මෝටර් රථ ඇණිය තිබුණු මෝටර් රථ ප්‍රවාහනය භාර නිලධාරියාගේ අධීක්ෂණයෙන් තොරව ධාවනය කර තිබීම නිසා, ව්‍යාපෘතිය මඟින් කුලී පදනම මත ලබාගෙන තිබුණු මෝටර් රථ හා ව්‍යාපෘතියෙහි විවිධ අංශ වෙත අනුයුක්ත කර තිබුණු මෝටර් රථ ධාවන කටයුතුවල ඵලදායිත්වය විගණනයේදී ඇගයීමට නොහැකි විය. මෝටර් රථ කුලී පදනම මත ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය එළඹ තිබුණු ගිවිසුමට අනුව, මසකට උපරිම වශයෙන් කිලෝ මීටර් 2,500 ක් ධාවනය කළ යුතු අතර ඊට වැඩිවන කිලෝ මීටර් ප්‍රමාණය සඳහා අමතර ගාස්තුවක් ගෙවිය යුතු වේ. ව්‍යාපෘතිය මඟින් අමතරව ධාවනය කළ කිලෝ මීටර් 118,283 ක් වෙනුවෙන් රු.මිලියන 7.15 ක මුදලක් ගෙවන අතරතුර වෙනත් මෝටර් රථ කීපයක් ධාවනය කළ යුතු උපරිම කිලෝ මීටර් ප්‍රමාණයට වඩා කිලෝ මීටර් 94,177 ක් ධාවනය කර තිබුණි. එසේම, ව්‍යපෘතිය මඟින් කුලී පදනම මත ලබාගෙන තිබුණු මෝටර් රථ ව්‍යාපෘතියෙහි එක් එක් අංශයට වෙන් කර දී තිබුණි. මෙම මෝටර් රථ ප්‍රවාහනය භාර නිලධාරියාගේ අධීක්ෂණයෙන් තොරව ධාවනය කර තිබීම හේතුවෙන් ධාවනයෙහි යොදවා තිබුණු බව විගණනයේදී පිළිගත නොහැකි විය. | මෝටර් රථ අයථා පරිහරණයට ඉඩ තිබීම. | අලාභ හා අයථා පරිහරණයන් අවම කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | මෝටර් රථ ඇණියේ ඇති වාහන කාර්යක්ෂම හා ඵලදායීව ධාවනය සඳහා යොදවා ගනු ලබන බව තහවුරු කර ගැනීම අවශ්‍ය වේ. |

## 3.7 ඉඩම් අත්පත් කර ගැනීම

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අත්පත් කරගෙන තිබුණු ඉඩම් සඳහා ගෙවිය යුතු මුළු වන්දිය වූ රු.මිලියන 224.92 ක පිරිවැයෙන්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය ප්‍රකාරව ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම වූ රු.මිලියන 77.37 ක මුදල පමණක් ගෙවා තිබුණි. ඉතිරි ශේෂය වූ රු.මිලියන 147.55 ක මුදල ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුවේ නිර්දේශය මත ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමේදී සොරකම් හා වංචාවන් ඇති වීමට ඉඩ තිබීම. | අදාල නීතිමය රාමුව පදනම් කරගෙන හා ශ්‍රී ලංකා රජයේ ගිවිසුම්ගත සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සැලකිල්ලට ගෙන ඉඩම් අත්පත් කර ගැනීමෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සඳහා වන්දි ගෙවන ලදී. | ගෙවීම් කිරීමේ සාධාරණත්වය සනාථ කිරීම සඳහා අතිරේක ගෙවීම් සඳහා වන වාර්තා තබාගත යුතුය. |